
සී. මර්ෂාක්

ළපයා - ගපනා



සී. මර්ෂාක්


පෙයා-හාසු



අනුවාදය

දැදිගම වී. රුද්‍රිගු

කුරුලු පොත්
594/1, නාවල පාර, රාජගිරිය
දු.ක. 2863350/071-8263828



අයියාගෙ නම කොල්යා
මල්ලිගේ නම වාස්යා


අයියා පස්වැනි පන්තියෙ
මල්ලි තුන්වැනි පන්තියෙ
අවුරුද්දක් ගත වූ කලට
මල්ලි යාවි ඉහළ පෙළට


දඩයම් බල්ලෙක් ඔවුන්ට හිටියා
උෟට නමක් විය 'ලපයා' කියලා

ඕනෑම බඩුවක් කටින් ගෙන එනා
බෝල ගහන්නට ලපයා හපනා

බෝලය ඈතට විසි කළ විගසින්
ලපයා දුව ගොස් ගෙන එයි සැණෙකින්


ළමයින් සමගින් පාසල් යනවා
ආපසු එනතුරු බලා ඉන්නවා






පාන්දරින් නැගිට ලා
අයියා මලෝ එක් වෙ ලා
මග විසිතුරු බල බ ලා
පාසල වෙත යති ලො ලා

ආදරයෙන් අත් ලෙවමින්
ලපයා ඉල්ලයි කිසිවක්
කොපි පොත් හෝ පැන්සලක්!
ගෙන යයි දෙන ඕනෑ දෙයක්





නිවාඩු දවසකි එදා
අයියා මලෝ එක් වෙලා
තාත්තා ද සමගිනා
සෙල්ලම් පිටියට ගියා
බෝලය උඩ යයි අහසේ
ලපයා දුවයි ඒ අස්සේ




සෙල්ලම් පිටියට එදා පටන්
බල්ලන් හට එන්නට තහනම්



ළමයින් හා දෙමාපියෝ
දවසක් ඇවිදින්ට ගියෝ
සවස කාර්එකේ නැගී
පිටත් වුණා ගෙදර බලා






කාර්එකෙන් යන කලටා
ඔවුහු බලති වටා පිටා

කළු පාට - කහ පාට
කුරු පාද ඇති අගේ
ලපයාද වේගයෙන්
දුව එනවා මග දිගේ

දරුවෝ ලපයා දකිති
මව හට මේ ලෙස කියති
"අපේ ගෙදර ලපයා නේද?
අර ගනිමු! අර ගනිමු!!
උඹ අපේ කාර් එකට"
"නැගපන් ලපයෝ නැගපන්"

ලපයා දැන් කාර් එකේ
වාඩි වී යස රඟට
රියැදුරා පසෙකි නා
ලපයා යයි සතොසි නා
මගතොටද බලමි නා





මීයන් රංචුවක් ඇවිත්
ගෙදර අපට හරි කරදර
ඕනෑය පූසෙක්
ගෙදර ඇති කරන්නට
අම්මාද තාත්තාද
නිතර විය කියන්නට



බෝ දුර කතරින්
ආපි අමුත්තෙක්
දිග ලොම් - පිම්බුන
වල්ගය ඇත්තෙක්

ඇඟපත පිම්බුන
හොඳ පෙනුමැත්තෙක්
දුටුවන් බය වෙන
බළල් රාජයෙක්!



ලපයා දෙස
බලමින් මේ පූසා
සණ්ඩු කරන්නට
සැරසෙයි විගසා

දුන්නක් සේ පිට
වකුටු කරන්නේ
ප්රෑ-ස් ප්රෑ-ස් ගා
කටින් පිඹින්නේ

නියපොතු දික් කොට
දත් නියවන්නේ
පහරක් දෙන්නයි
දැන් සැරසෙන්නෙ





අම්මා ඇවිදින්
සණ්ඩුව බේරයි
ලපයට බණිමින්
අහකට ගෙන යයි



ලපයා පූසාට
යළි හමුවෙන්නෙ
"අහකට දුවපිය"
රොසින් කියන්නෙ

මේ දෙන්නාගෙ හබෙ
නවතින්නෙ නෑ වගේ
ලපයා කූඩුවේ දමා
දොර යතුරු දමන්නට





දබරයට පූසා
නැවත සැරසෙන්නෙ
නමුත් හරි බය ගුල්ලා
බොරුවටයි පොර කන්නෙ

අයියයි මල්ලියි
මේ ගැන හිතලා
මහ තඩි බළලා
අල්ලා බිමලා

ආපු දිහාටම
පලයන් කියලා
ගෙදරින් සදහට
පිටමන් කෙරුවා



Cover Design by H. Pradeep Darshana, Ragama. Tel: 0772876280

Printed by : Samayawardhana Printers (Pvt) Ltd - Colombo 10.

ISBN 978-955-591-240-2

මිල රු.180/=

කුරුළු පොත් ප්‍රකාශකයෝ

594/1, නාවල පාර, රාජගිරිය දුරකථනය : 011-2863350/071-8263828